# කොරෝනා නිසා වෙහෙසෙන සිරිලක වනිතාවෝ

කොවිඩ්-19 (Covid-19) හෙවත් කොරෝනා (Corona) වෛරසය ලොව පුරාම වසංගතයක් ලෙස ව්‍යාප්ත වී ව්‍යසනයක් වෙමින් තිබෙන උණුසුම් වටපිටාවක සිටයි මෙම සටහන තැබෙන්නෙ.

ඒ අතරතුරේ දී ශ්‍රී ලංකා අපේ මවු බිමටත් මේ වෛරසය ඇතුළු වුනා. එහි පළමු රැල්ල ඉතාමත් සාර්ථකව පාළනය කරන්නට රටක් විධියට හැමෝම අත්වැල් බැඳ ගත්තා. මේ වන විට එහි දෙවන රැල්ල තරමක් අවධානම් ව මතු වී තිබෙනවා. රජය මැදිහත්ව රාජ්‍ය හා පෞද්ගලික අංශ එකට එකතු වී ශ්‍රී ලාංකික හැම දෙනාම පාහේ එක අරමුණකට වී දෙවන රැල්ලෙන් ද අපගේ රට මුදවා ගැනීමට ගත වෙන හැම තත්පරයකදීම වෙහෙස වෙන වෙලාවක, එකී වැඩ කටයුතු අතරින් අඩුවෙන් කතිකා වූ පැතිකඩක් මතු කරන්නට යි මේ සටහන.

"සෞඛ්‍ය-ආරක්ෂාව" යන වචන යුගලය අද වන විට සෑම දෙනාගේ ම පාහේ එදිනෙදා භාවිතා වන වචන මාලවේ සුලබ ව ඇහෙන වග සැබෑවකි. කොයි කාගේත් බලාපොරොත්තුවත් සෞඛ්‍ය-ආරක්ෂාව සහිත ව ජීවත් වීමයි. කොරෝනා වෛරසයට හසු නොවී සිටීමයි. "ආරෝග්‍යා-පරමා ලාභා", නිරෝගීකම සැපතයි යන්න යලි යලිත් සනාථ කරන තත්වයකට අද සමාජය මුහුණ දෙමින් සිටින්නේ.

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රධාන තනතුර හෙවත් සෞඛ්‍ය අමාත්‍ය ධූරය හොබවන්නේ වනිතාවක් ය. ඇමතිතුමිය සිය කාර්යය මණ්ඩලය සමඟ උරෙන් උර ගැටී අමිල කාර්යභාරයක් ඉටු කරමින් සිටින වගට උදාහරණ ඕනෑ තරම්ය. ඉන් ඔබ්බට, කොරෝනා වසන්ගතයෙන් මිදීමට එම ක්‍රියාන්විතයට සිරිලක සිව් දිගින් කාන්තාවෝ සිය දායකත්වය නොමසුරුව ලබා දෙන බව නොරහසක්. විශේෂඥ හා වියත් වෛද්‍යවරියන්, හෙද පාළිකාවන්, හෙද නිළධාරිනියන්, සාත්තු සේවිකාවන් හා රොහල් සුවසේවා සේවිකාවන් ආදී කොටගත් විවිධ තනතුරු හා නිලතල හොබවන කොලඹ ජාතික රොහලේ හා කොලඹ අනෙකුත් නම් කරන ලද ප්‍රධාන රොහල් වලත් ඉන් පිටත ප්‍රධාන නගර සහ ග්‍රාමීය ආදී සෑම රොහලක ම පාහේ සෘජු හා වක්‍ර ලෙස කොරෝනා වසංගතය මැඩලීමට දයක වෙමින් සිටින වනිතාවන්ව අගය කළයුතු නොවේද?

තව ද ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තමේන්තුව හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළු නීතිය හා සාමය සුරක්ෂා කිරීමෙහි ලා සේවයේ නියුතු කාර්යය මණ්ඩල වල කාන්තා නිළධාරිනියන්ගේ කැප වීම හා අඛණ්ඩ සේවය ප්‍රශංසනීය යි.

තව ද මධ්‍යම රජය හා පළාත් සභා යටතේ අත්‍යාවශ්‍ය භාණ්ඩ හා සේවා සම්පාදනයෙහි ලා දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කර්යාල, නගර සභා, ප්‍රාදේශීය සභා, ග්‍රාම නිලධාරී කාර්යාලයන් හි පවතින අවධානම හා  අවම පහසුකම් පිළිබඳව නොතකා සිය වෘත්තීන් හි නොපැකිලිව හ කඩිසරව නිරත වී සිටින වනිතාවන් ස්තූති පූර්වකව සිහිපත් කළ යුතුමය.

ඒ විතරක් ද නොව අත්‍යාවශ්‍ය සේවා ලෙස නම් කර ඇති ගොවිතැන්, වගා කටයුතු, ධීවර කටයුතු, ආහාර සැකසුම් හා සැපයීම්, පිරිසිදු කිරීම් හා සමීපාරක්ෂක කටයුතු, බැංකු හා මූල්‍ය සේවා, වියලි අහාර හා වෙළඳ සේවා ආදී මෙහි සටහන් කල හා නොකල සියළු අංශයන් හි

කාර්ය මණ්ඩල සාමාජිකාවන් ද කොරෝනාව මැඩලීමේ සංග්‍රාමයට අත් වැල් බැඳ ගෙන එක්ව සිටීම පැසසිය යුතුමය.

ඊට අමතරව විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය ආයතනයන් ජනමාධ්‍යවේදීනියන් පවතින වසංගත තත්වය හමුවේ දිව රෑ නොබලා ඉටු කරන මාධ්‍ය මෙහෙවර අනභිබවනීය යි.

හුදෙක් වැඩිමනත් අවධානයක් හා ඇගයීමක් නොලත් එසේම නිල නොලත් කාන්තා කර්යමණ්ඩලයක් නිවෙස් වල දොර වැසූ තත්වය යටතේ වෙනදාට ත් වඩා වැඩි රාජකාරී රැසක නිරතව සිටී. වරින් වර ප්‍රාදේශීය වශයෙන් ඇඳිරිනීතිය මැද, පාසල් හා ආයතනයන් විශේෂ නිවාඩු යටතේ ගෙදර පරිසරය වෙනස් හා කාර්යය බහුල මුහුණුවරක් ගෙන තිබේ. දෛනික කටයුතු අතර ඉවුම් පිහුම් හා ආහාරපාන පිළියෙල කිරීම, දරු පැටවුන් නිසා නිතර අපිළිවෙල වෙන ගේ දොර අතුපතු ගෑම හා පිරිසිදු කිරීම, තවත් සමහර විටෙක දරුවන් අතර මෙන්ම තවත් තැනක කෙළිලොල් පිය-පුතුන් අතර රණ්ඩු අඬ දබර, "නඩු-හබ" විසඳීම හා ගෘහස්ථ "ඝෝෂා" ඉවසීම ආදී සුපුරුදු හා නුපුරුදු වැඩ රාජකාරි රාශියක් නිහඬව ම නිවෙස් තුළ ගෘහණියක ලෙස, අම්මා ලෙස, බිරිඳ ලෙස යුවතිය බැරෑරුම් ක්‍රියාන්විතයක නිරතව සිටින්නීය. බාහිර සමාජයෙන් ඈත් කර තබා ගැනීමේ මූලික අරමුණ වෙනුවෙන් ඇයගේ මෙහෙවර ඉතා ප්‍රබල වේ.

ඒ අතරතුර සමාජ මාධ්‍ය හරහා පොදුවේ ගෘහණිය හා යුවතිය ඉලක්ක කර දියත් වෙන අවලාද, ගැරහුම්, උසුළු-විසුළු හා සම්ච්චල සටහන් ද අඩුවක් නැතිව හුවමාරු වෙන වටපිටාවක ඇය මේ සියල්ල මද සිනහවකින් විඳ දරා ගනිමින් නියමිත රාජකාරීන් නොඅඩුව අනලස්ව ඉටු කරන්නීය.

කොරෝනා වසංගතයෙන් රටම මුදා ගැනීමේ සද් කාර්යයෙහි රටක් ලෙස ඉදිරියට යන මේ කාල වකවානුවේ දී සිරිලක යුවතිය, දුවක හෝ, සොයුරියක හෝ, තරුණියක හෝ, මවක හෝ, වෘත්තීයවේදිනියක හෝ සමාජ සේවිකාවක ලෙස විවිධ චරිතාංගයන් හි හිඳ ඉතා උත්තුංග මෙහෙවරක නියලෙමින් සිටින්නීය.

කොරෝනාව වසංගයෙන් ඉතා ඉක්මනින් මිදීමට රටට ජාතියට හැකි වේවා යි කෙරෙන ප්‍රාර්ථනාව සැබෑ වෙන දිනයේ දී ඊට වෙහෙසුනු සිරිලක විසිරුණු සුවහසක් වනිතාවන්ට ගෞරව උපහාරයක් ම වෙනු ඇති.